# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07

විභාග පූර්ව පරීක්ෂණය (අ.පො.ස. උ/පෙළ)
13 ශ්‍රේණිය
දේශපාලන විද්‍යාව
2016 ජූනි

කාලය පැය 02 යි

නම:- ............................................... අංකය:-.............................. පන්තිය:-........

- ❖ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ❖ ඔබට සපයන පිළිතුරු පත්‍රයේ පමණක් පිළිතුරු සලකුණු කරන්න.

**1-17 දක්වා ඇති ප්‍රශ්නවලට නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.**

1. දේශපාලන විද්‍යාව
   1- රාජ්‍යය සහ ආණ්ඩුව පිළිබඳ විද්‍යාවයි.
   2- න්‍යායාත්මක දේශපාලනය හා ප්‍රායෝගික දේශපාලනයෙන් සමන්විත වේ.
   3- සමාජ විද්‍යාත්මක විෂයකි.
   4- විද්‍යාත්මක ක්‍රමවේදයන් භාවිතා කරමින් ද අධ්‍යයනය කළ හැකිය.
   5- ක්‍රමානුකූලව අධ්‍යයනය ක්‍රි.පූ. 2 වන සියවසෙන් ආරම්භ විය.

2. නවීන රාජ්‍ය හැඳින්වීම සඳහා යොදාගත හැකි ප්‍රකාශනයකි.
   1- භූමිය, ජනගහනය, ආණ්ඩුව හා ස්වාධිපත්‍යයෙන් සමන්විත සමාජයීය සංවිධානයකි.
   2- ජාත්‍යන්තර පිළිගැනීමක් අත්‍යාවශ්‍ය සාධකයක් වී ඇත.
   3- රාජ්‍යයේ පැවැත්ම අනෙකුත් රාජ්‍යයන්ගේ පිළිගැනීම මත තීන්දු වේ.
   4- එක් ජාතියක් එක් රාජ්‍යයක් සහ මූලධර්ම මත පදනම් වී ඇත.
   5- සමාජ සංවිධාන අතරින් උත්තරීතරම සංවිධානයයි.

3. ජාතික රාජ්‍යයන්ගේ නැගී ඒම හා සෘජුවම සම්බන්ධ වූ කාරණයකි.
   1- ශුද්ධ රෝමානු අධිරාජ්‍යය බිඳ වැටීම.
   2- ප්‍රොතෙස්තන්ත ආගමික ප්‍රතිසංස්කරණ
   3- ස්වාධිපත්‍ය සංකල්ප
   4- රජවරුන්ගේ දිව්‍යමය අයිතිවාසිකම් පිළිබඳ සංකල්ප
   5- දාර්ශනිකයන්ගේ නව දේශපාලන චින්තන

4. තුලනාත්මක අධ්‍යයන ක්‍රමය
   1- අතීතයේ සිටම භාවිතයට යොදාගත්තකි.
   2- ඇරිස්ටෝටල් විසින් මුල් වරට යොදාගන්නා ලදී.
   3- අධ්‍යයන ක්‍රමයේ හරය වන්නේ ආණ්ඩුවේ කාර්යභාරය තක්සේරුවයි.
   4- ප්‍රභේද තුනකින් යුක්ත වේ.
   5- දේශපාලන ආයතනයන්ගේ නීතිමය ව්‍යුහයන් පමණක් හැදෑරිය හැකියි.

5. ජාතිකත්වය වර්ධනය වීමෙහිලා බලපාන සාධකයකි.
   1- වාර්ගික සමතාවය
   2- ජාත්‍යන්තර කුමන්ත්‍රණවලට මුහුණ දීම
   3- පොදු ඉතිහාසයක් පැවතීම
   4- පොදු ආශාවන් තිබීම
   5- පොදු ආගමක් පැවතීම

6. රාජ්‍ය සම්බන්ධ මාක්ස්වාදී මතයකි.
   1- සමාජයේ පොදු යහපත සඳහා ක්‍රියාත්මක වේ.
   2- ධනපති පන්තියේ නිෂ්පාදන මාර්ග ආරක්ෂා කර ගැනීමට සංවිධානය කෙරුණකි.
   3- ධනපතීන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමට නීති පනවයි.
   4- රාජ්‍ය සතු සියලු සම්පත් දේපොළ හිමි පන්තිය විසින් පාලනය කරයි.
   5- සමාජය ඇති නැති ලෙස පන්ති බෙදීමකට පෙර රාජ්‍යයක් නොතිබුණි.

7. ස්වාධිපතිවාදය බිඳවැටීම කෙරෙහි බලපාන කරුණු වන්නේ,
   1- සංකල්පීමය දුර්වලතා
   2- ව්‍යවස්ථානුකූලවාදයේ වැඩියම
   3- සන්ධීය රාජ්‍ය ක්‍රමයේ ආරම්භය
   4- ජාත්‍යන්තර වාදයේ වැඩියාම
   5- බහුපක්ෂ ක්‍රමය වර්ධනය වීම

8. ජෝන් ඔස්ටින් ට අනුව නීතියක් බලාත්මක වීමට තිබිය යුතු ගුණාංග වන්නේ
   1- ස්වාධිපති බලය පදනම් කර ගත් දෙයක් වීම
   2- ජනතා අභිමතය නිරූපණය වීම
   3- ස්වාධිපතිගේ නියෝගය වීම
   4- නීතිය යටතේ අය ප්‍රශ්න කිරීමකින් තොරව අවනත වීම
   5- අවනත නොවන විට බලය යොදා අවනත භාවය ලබාගැනීම

9. සරල බහුතර නියෝජන ක්‍රමය
   1- ඡන්ද දායකයා සහ නියෝජිතයා අතර සම්බන්ධතාවය සමීප කරවයි.
   2- මැතිවරණ දෙකක් අතරතුර මහජන මතය මැන බැලීමට හැකි වේ.
   3- සෑම දේශපාලන කණ්ඩායමකටම නියෝජනයක් ලබාදෙයි.
   4- ප්‍රබල දේශපාලන පක්ෂ ක්‍රමයක් බිහිවීමට වැඩි ප්‍රවණතාවක් දක්වයි.
   5- ප්‍රබල විරුද්ධ පක්ෂයක් බිහිවීමට ද මග පාදයි.

10. සමානුපාතික නියෝජන ක්‍රමයේ ලැයිස්තු ක්‍රමයට අනුව,
   1- දේශපාලන පක්ෂ විසින් මැතිවරණය සඳහා අපේක්ෂක නාම ලැයිස්තුවක් ලෙස ඉදිරිපත් කරයි.
   2- බහුමන්ත්‍රී මැතිවරණ කොට්ඨාස ක්‍රමය පදනම් කර ගනියි.
   3- තෝරාපත් කර ගැනීමට නියමිත මන්ත්‍රී ආසන සංඛ්‍යාවට සමානව අපේක්ෂකයන් නම් කරයි.
   4- ලැයිස්තුවේ අපේක්ෂකයන් නම් කර ඇති අනුපිළිවෙළට ඔවුන්ට ආසන හිමි වේ.
   5- ඡන්ද දායකයාට හිමිවන්නේ එක් ඡන්දයක් පමණි.

11. දේශපාලන ප්‍රචණ්ඩත්වය
   1- රාජ්‍ය විරෝධී බලවේග තුළින් මතුවිය හැකිය.
   2- ආණ්ඩුව එය ක්‍රියාත්මක කරන්නේ නිල ආයතනයික සබඳතාවයන් හරහා ය.
   3- එය දේශපාලන බල අරගලයට අවශ්‍ය සදාචාරාත්මක විනිශ්වයක් ලබා දේ.
   4- දේශපාලකයන් විසින් මහජන මතය නොසලකා හැරීම තුළින් එය මතුවිය හැකිය.
   5- භාවිතයට ගන්නා ස්වභාවය මත කැරලි, විප්ලව, යුද්ධ වශයෙන් ප්‍රචණ්ඩත්වය මුදා හැරිය හැක.

12. දේශපාලන සමාජානුයෝජනය
   1- මිනිසුන් තමන් ජීවත් වන දේශපාලන ක්‍රමයට අනුගත කරන ක්‍රියාදාමය වේ.
   2- මිනිසුන් දේශපාලනයට අවශ්‍ය දූෂිත භාවිතයන් ඉගෙන ගන්නා ක්‍රියාදාමය වේ.
   3- මිනිසුන් දේශපාලන දැනුම හා අවබෝධය වර්ධනය කර ගන්නා ක්‍රියාදාමය වේ.
   4- මිනිසුන් තම ගතිගුණ ආකල්ප, විශ්වාස හා අගය කිරීම හැඩගසා ගන්නා ක්‍රියාදාමය වේ.
   5- මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නා ක්‍රියාදාමය වේ.

13. බලපෑම් කණ්ඩායම්
1- ආණ්ඩුවේ බලය ක්‍රියාත්මකකිරීමේ කාර්යයට නිල වශයෙන් දායක වේ.
2- සිය ආර්ථික අවශ්‍යතා අනුව දේශපාලන ප්‍රතිපත්ති සකස් කර ගනී
3- රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා තොරතුරු සපයනු ලැබේ.
4- ආර්ථික ආශාවන්ගෙන් පරිබාහිරව ද බලපෑම් කණ්ඩායම් ඇති කර ගනියි.
5- පෞද්ගලික ආශාවන් මෙන්ම පොදු අරමුණක් ඉටුකර ගැනීම සඳහා ද ඒකරාශි වේ.

14. මහජන මතය
1- පොදු කරුණු ගැන ජනතාව තම මතය ප්‍රකාශ කරන මාධ්‍ය වේ.
2- ආණ්ඩුවේ ජනප්‍රියතාවය මැනීමට යොදාගත හැකි මාධ්‍ය වේ.
3- රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ජනතා ප්‍රතිචාරය මැන බැලීමට යොදාගත හැකි මාධ්‍ය වේ.
4- ජනතා මනස පාලනය කිරීමට ආණ්ඩුවේ භාවිතයට ගත හැකි මාධ්‍යයක් වේ.
5- ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක යහපත් පැවැත්ම සඳහා අවශ්‍යම සාධකයක් වේ.

15. සිවිල් සමාජය,
1- දේශපාලන බලය කියාපාන කතිපයාධිපති පංතියේ ඒකාධිකාරයක් බවට පත්වීම වළක්වාලීමට පියවර ගනියි.
2- යහපාලනය විධිමත් වීම වළක්වන ප්‍රතිවිරෝධකයක් වශයෙන් ක්‍රියා කළ හැක.
3- ආණ්ඩුකරණය පිළිබඳ මුර බල්ලෙකු සේ ක්‍රියාකිරීමට හැකියාවක් ඇත.
4- සමාජ සේවාවන් හා පොදු සමාජ කාර්යයන් සඳහා උරදිය හැක.
5- පුද්ගලයන් සාමූහික සමාජ ක්‍රියාවලියට හුරු පුරුදු කරනු ඇත.

16. යහපාලනය මගින්
1- සහභාගිත්ව සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතුය
2- රාජ්‍ය විය පැහැදම් පිළිබඳ ජනතාවට දැන ගැනීමට හා ඒ පිළිබඳව ප්‍රශ්න කිරීම කළ හැකිය.
3- පාලකයන්ගේ අවශ්‍යතාවයන්ට ජනතාව ඇහුම්කන් දී ඒවාට ප්‍රතිචාර දැක්විය හැකිය.
4- සමාජ ධනය සාධාරණ ව බෙදී යා යුතුය.
5- සම්පත් කාර්යක්ෂමව හා ප්‍රතිඵලදායී ලෙස භාවිතයට ගත යුතුය.

17. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාදාමයට ඇතුළත් වන්නේ
1- ප්‍රතිපත්ති ප්‍රාරම්භය
2- ප්‍රතිපත්ති නිර්මාණය
3- ප්‍රතිපත්ති අත්හදා බැලීම
4- ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම
5- ප්‍රතිපත්ති ඇගයීම

**18 සිට 25 දක්වා ප්‍රශ්නවලදී නිවැරදි පිළිතුර කාණ්ඩය තෝරන්න.**

18. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක
A. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයට පදනම් වේ.
B. සමාජවාදී ආර්ථික න්‍යාය අනුගමනය කරයි.
C. ආර්ථික සැලසුම්කරණයට රජය සෘජුව මැදිහත් වේ.
D. මධ්‍යගත සැලසුමක් යටතේ ආර්ථිකය පාලනය වේ.
E. රාජ්‍යය නමැති සංවිධානයේ පැවැත්ම අවශ්‍ය බව පිළිගනියි.

1) ABCD 2) ABCE 3) ABDE 4) ACDE 5) BCDE

19. දේශපාලන සමාජානුයෝජනයට මැදිහත්කරුවන් වන්නේ
A. ව්‍යාපාරිකයන්ය.
B. ජනමත නායකයන් ය.
C. ආර්ථික සාධකයන් ය.
D. දේශපාලන පක්ෂ ය.
E. ජන සන්නිවේදන මාධ්‍යයන් ය.

1) ABCD 2) ABCE 3) ABDE 4) ACDE 5) BCDE

20. නූතන ආණ්ඩුක්‍රමයන් හි විධායකය බලවත් වීමට බලපෑ සාධකයන් ය.
A. රාජ්‍යයේ අභ්‍යන්තර කටයුතු සංකීර්ණ වීම
B. අධිකරණ තීන්දු
C. රාජ්‍යයේ අන්තර්ජාතික කටයුතු සංකීර්ණ වීම
D. දේශපාලන පක්ෂ ක්‍රමය වර්ධනය වීම
E. විධායකය සෘජු මහජන ඡන්දයෙන් තේරාගැනීම

1) ABCD 2) ABCE 3) ABDE 4) ACDE 5) BCDE

21. එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා විසින් තනිව ක්‍රියාවට නැංවිය හැකි බලතල ඇතුළත් වන්නේ
A. ජාතික නත්තල් ගස දැල්වීම
B. රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීම
C. නීති පැනවිය යුතු ප්‍රතිපත්ති නිර්දේශ කිරීම
D. ජාතික වශයෙන් වැදගත් රාජ්‍ය පණිවුඩ නිකුත් කිරීම
E. ජාතික වීරයන්ට පදක්කම් පැළඳවීම

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

22. ඇමරිකා එක්සත් ජනපදයේ සෙනෙට් මණ්ඩලයේ බලතල වන්නේ
A. මුදල් නොවන පනත් ආරම්භ කිරීමේ බලය
B. මුදල් පනත් සංශෝධනය කිරීමේ බලය
C. දෝෂාභියෝග විනිශ්චය කිරීමේ බලය
D. විදේශ ගිවිසුම් අනුමත කිරීමේ බලය
E. ඉහළම අභියාචනා අධිකරණ බලය

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

23. ස්විට්සර්ලන්තයේ විධායකය
A. සාමූහික සංවිධානයකි.
B. සාමාජිකයන් 7 කින් සමන්විත වේ.
C. එය සන්ධීය සභාව නමින් හැඳින්වේ.
D. සන්ධිය මහාමණ්ඩලය විසින් පත් කරයි.
E. සභාපති අනෙක් සාමාජිකයන්ට වඩා උත්තරීතර වේ.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

24. ඉන්දියාවේ ලෝක් සභාවට
A. නීති සම්පාදනය කිරීමේ බලය හිමි වේ.
B. මුදල් පනත් සංශෝධනය කිරීමේ බලය හිමි වේ.
C. මුදල් පනත් සම්මත කිරීමේ බලය හිමි වේ.
D. විධායකය පාලනය කිරීමේ මෙහෙයවීමේ බලය හිමි වේ.
E. හදිසි නීතිය ප්‍රකාශයට පත්කිරීම රාජ්‍ය සභාව සමග හවුලේ සිදු කරයි.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

25. ප්‍රංශ පාර්ලිමේන්තුවේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට
A. මූලික නීති හා සාමාන්‍ය නීති සංශෝධනය කිරීමේ බලය හිමි වේ.
B. මූල්‍ය පාලනය පිළිබඳ පූර්ණ බලතල හිමි වේ.
C. ජනාධිපතිට එරෙහිව දෝෂාභියෝගය ගෙන ඒමට බලය හිමි වේ.
D. ගිවිසුම් හා සම්මුතීන් සඳහා අනුමැතිය දීමේ බලය හිමි වේ.
E. කොමිෂන් සභා පිහිටුවීමට බලය ඇත.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

**අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට අයත් පිළිතුරු අතරින් සාවද්‍ය පිළිතුරු තෝරන්න.**

26. 1833 කෝල්බෘක් නිර්දේශයන් හි අඩංගු වූයේ,

1- රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
2- ඉංග්‍රීසි අධ්‍යාපනය ඇතිකොට සිවිල් සේවය මෙරට ජනතාවට විවෘත කිරීම
3- රජයේ වෙළඳ අධිකාරිය හරහා නිර්බාධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම
4- ආණ්ඩුකාරවරයාගේ බලතල සීමා කර ව්‍යවස්ථාදායක සභාවක් පිහිටුවීම
5- එකම උසාවි ක්‍රමයක් අධිකරණ ප්‍රඥප්තියක් රට තුළ ඇති කිරීම.

27. 1910 කෲව් මැකලම් ප්‍රතිසංස්කරණය

1- ආණ්ඩුකාරවරයාගේ බලතල අසීමිත ලෙස සීමා විය.
2- ව්‍යවස්ථාදායක සභාව මන්ත්‍රීවරු 21 කින් සමන්විත විය.
3- ප්‍රථම වරට සීමිත ඡන්ද ක්‍රමයක් ආරම්භ විය.
4- නිල නොලත් මන්ත්‍රීවරු සංඛ්‍යාව 10 දක්වා වර්ධනය විය.
5- මුදල් කාරක සභාව ඇති කරන ලදී.

28. 1920 මැනිං ආණ්ඩුක්‍රමය මගින් ආණ්ඩුකාරවරයාට

1- ලංකාවේ ආරක්ෂාව ට හා අභ්‍යන්තර ආරක්ෂාවට අවහිර වන ව්‍යවස්ථාදායකයේ ඕනෑම විවාදයක් නතර කිරීමේ බලය හිමිවිය.
2- බලතල වැඩිවීමක් සිදුවිය.
3- මහජන සුබසිද්ධිය උදෙසා යම් පනතක් අත්‍යාවශ්‍ය යැයි නම්කිරීමට බලය හිමිවිය.
4- ව්‍යවස්ථාදායකයේ මුලසුන හිමිවිය.
5- විධායක සභාවේ මුලසුන අහිමි විය.

29. ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය,

1- න්‍යායවාදී වූයේ 20 වන සියවසේ යුරෝපීය ලිබරල්වාදය
2- සම්මුතිවාදී දේශපාලනය ඔස්සේ යටත්විජිත පාලනය සමග සහයෝගිතාවයෙන් රට පාලනය කිරීම සිදුවිය.
3- සමාජ ක්‍රියාකාරකම් අරඹන්නේ ස්වදේශීය සාමාන්‍ය ජන කොටස් ඒකරාශී කර ගෙනය.
4- පදනම වැටුණේ ආගමික පුනර්ජීවන ව්‍යාපාරය ඔස්සේ ය.
5- 1921 න් පසු කාල පරිච්ඡේදය තුළ එය එක්සත් ව්‍යාපාරයක් නොවිය.

30. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ විධායක කාරක සභාව මගින්

1- ලාංකීය නායකයන් දේශපාලන නායකත්වයට පත්වීමට අවශ්‍ය පුහුණුව ලබාදුනි.
2- පෞද්ගලික මන්ත්‍රීවරයාගේ කාර්යභාරය ඉහළ ගියේය.
3- පරිපාලනයෙහි කාර්යක්ෂතාවය වැඩි විය.
4- කථිකෝද්‍ය සමිතියක් බවට පත්විය.
5- අතිරේක අයවැය ඇස්තමේන්තු පිළියෙළ කිරීමේ කාර්යභාරයට අයත් විය.

31. ඩොනමෝර් කොමිෂන් සභාව

1- වාර්ගික නියෝජනය පවත්වාගෙන යාමට උනන්දු විය.
2- ලාංකිකයන්ට අභ්‍යන්තර ස්වයං පාලන ආණ්ඩුවක් නිර්දේශ කරන ලදී.
3- දෙවන මණ්ඩලයක් පිහිටුවීමට කළ යෝජනාව පිළිගන්නා ලදී.
4- විධායක කටයුතුවල විශාල භූමිකාවක් ක්‍රියාවට නගන ව්‍යවස්ථාදායකයන් ඇති කිරීමට අපේක්ෂා කරන ලදී.
5- ආණ්ඩුකාරවරයාට ඉහළ බලතල ප්‍රමාණයක් පිරිනමන ලදී.

32. ඩොනමෝර් අමාත්‍ය මණ්ඩලය

1- තෝරාගනු ලැබුවේ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ නාමකරණයෙන් පත්වූ මන්ත්‍රීවරු අතරින් පමණයි.
2- ආණ්ඩුකාරවරයා විසින් නම් කරන ලදී.
3- වාර්ෂික අයවැය ලේඛනය පිලිබඳව සාමූහික ව වගකිව යුතු විය.
4- රාජ්‍ය නිලධාරීන් ව ඇතුළත් කරනු ලැබුවේ නැත.
5- සර්ව සිංහල අමාත්‍ය මණ්ඩලයකින් යුක්ත විය.

33. 1930 ගණන්වල වාමාංශික ව්‍යාපාරය

1- වෘත්තීය සමිති අයිතිවාසිකම් ලබාදීමට විරුද්ධ ව සංවිධානය කරන ලදී.
2- ලංකා ජාතික සංගමයේ අංශයක් වශයෙන් පිහිටුවන ලදී.
3- ලංකාවට පූර්ණ ජාතික නිදහස ඉල්ලා සිටින ලදී.
4- තමන්ගේ න්‍යායවාදය ලෙස ලිබරල්වාදය පිළිගන්නා ලදී.
5- පොපිමල් ව්‍යාපාරය සඳහා ප්‍රධාන දායකත්වයක් ලබාදෙන ලදී.

**ප්‍රශ්න අංක 34-38 දක්වා ප්‍රශ්නවල අදාළ නොවන්නා වූ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

34. ප්‍රංශ පාර්ලිමේන්තුවේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට

A. 1945 දී රාජ්‍ය මන්ත්‍රණ සභාව විසින් අනුමත කරන ලදී.
B. 1946 දී බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.
C. මුලින් සකස් කරනු ලැබුවේ ලංකාවට අභ්‍යන්තරික ස්වයං පාලන ආණ්ඩුවක් ලබාදීම සඳහාය.
D. දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පැනවීම මගින් ඉවත් කරන ලදී.
E. ලංකාවට පූර්ණ නිදහස ලබාදීමට යෝජනා කරන ලදී.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

35. සෝල්බරී ආණ්ඩුක්‍රමය යටතේ අගමැතිවරයා,

A. පාර්ලිමේන්තුවේ බහුතර මතය මත රඳා නොසිටියේය.
B. ආණ්ඩුකාරවරයා තම අභිමතයෙන් තෝරාගන්නා ලදී.
C. කැබිනට් අමාත්‍ය මණ්ඩලය තුළ සාමූහික වගකීම පවත්වා ගන්නා ලදී.
D. තනිවම ව්‍යවස්ථාව වෙනස් කිරීමට බලය ඇතිව සිටියේය.
E. රැජිනගේ කැමැත්ත ඇතිතාක් ධුරය දැරීමට බැඳී සිටියේය.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

36. සෝල්බරී ක්‍රමය තුළ කැබිනට් මණ්ඩලය,

A. පාර්ලිමේන්තු මණ්ඩල දෙකකින්ම තෝරාගන්නා ලදී.
B. පාර්ලිමේන්තුවට සාමූහික ව වගකීම අවශ්‍ය නොවීය.
C. ඡන්ද දායකයා විසින් සෘජු ලෙසම තෝරාගන්නා ලදී.
D. රාජ්‍ය සේවාව පාලනය කිරීමේ බලය සහිත විය.
E. නිල කාලය වසර 4 ක් විය.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

37. සෝල්බරී ක්‍රමය තුළ පාර්ලිමේන්තුව

A. ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකයක් සහිත ව තිබිණි.
B. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් සීමා නොකළ බලතල පැවතිණි.
C. අධිකරණ ප්‍රතිනිරීක්ෂණයට යටත් ව නීති පනවන ලදී.
D. පුද්ගලයන් මූලික කර ගෙන සුළුතර කණ්ඩායම්වල අයිතිවාසිකම් තහවුරු කිරීමට දැඩි පියවර ගන්නා ලදී.
E. පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය ආරක්ෂා කිරීමට සීමාවන් පනවන ලදී.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

38. සෝල්බරි ක්‍රමය යටතේ ආණ්ඩුකාරවරයා

A. අගමැති විසින් පත් කරන ලදී.
B. හදිසි අවස්ථාවක සත්‍ය විධායක බවට පත්වීමට බලය ඇතිව සිටියේය.
C. අගමැතිවරයාගේ උපදෙස් පිළිපැදීමට බැඳී සිටියේ නැත.
D. නඩු පැවරීමෙන් නිදහස් ව සිටියේය.
E. නිල කාලය වසර 05 ක් විය.

i) ABCD  ii) BCDE  iii) ABDE  iv) ACDE  v) ABCE

39. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,

A. අධිකරණය ආණ්ඩුවේ ත්‍රිවිධ ආයතනවලින් දුර්වල ආයතනය බවට පත්කරන ලදී.
B. ශ්‍රී ලංකාවේ ප්‍රථම දේශජ ව්‍යවස්ථාවයි.
C. නීති සම්පාදනය පිළිබඳ අධිකරණ පූර්ව විවරණය හඳුන්වා දෙන ලදී.
D. උත්තරීතරම ස්වාධිපති බලය සහිත ව්‍යවස්ථාදායකයින් නිර්මාණය කරන ලදී.
E. හදිසි අවස්ථාවකදී අගමැතිගේ බලතල දුර්වල තත්වයට පත් කරන ලදී.

i) ABCD  ii) BCDE  iii) ABDE  iv) ACDE  v) ABCE

40. පළමු ජනරජයේ ජනාධිපතිවරයා

A. නඩු පැවරීමෙන් නිදහස් විය.
B. තවදුරටත් බ්‍රිතාන්‍ය රැජිනගේ නියෝජිතයෙකු විය.
C. නඩු පැවරීමෙන් නිදහස් විය.
D. නාමික විධායකයෙකු ලෙස ව්‍යවස්ථාවෙන් පැවරී ඇති කාර්යය ඉටුකරන්නෙකු වේ.
E. ආණ්ඩුව ප්‍රතිපත්ති ප්‍රකාශය පරාජයට පත්වීමෙන් පසු පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට අගමැති දෙන උපදෙස් නොසලකා හැරීමට බලය සතුව තිබිණි.

i) ABCD  ii) BCDE  iii) ABDE  iv) ACDE  v) ABCE

41. ජාතික රාජ්‍ය සභාව

A. ජනාධිපතිවරයා ඉවත් කිරීමට බලය හිමිවිය.
B. අවුරුදු හයක කාලයකට තෝරා පත් කර ගන්නා ලදී.
C. නව ව්‍යවස්ථාවක් පනවා පැවති ව්‍යවස්ථාව ඉවත් කිරීමට බලය සතුව සිටියේය.
D. රාජ්‍ය මූල්‍ය පාලනයේ පූර්ණ බලතල හිමිවිය.
E. හදිසි අවස්ථා තත්වයක් පැනවීමට සුදුසු කාලය යැයි තීරණය කරන ලදී.

i) ABCD  ii) BCDE  iii) ABDE  iv) ACDE  v) ABCE

42. 1972 ව්‍යවස්ථාව යටතේ අගමැතිවරයා

A. ජාතික රාජ්‍ය සභාවේ විශ්වාසය නැතිව ගිය විට ඉල්ලා අස්විය යුතුය.
B. හදිසි අවස්ථා තත්වය පැනවූ විට ව්‍යවස්ථාව ඉක්මවා ක්‍රියාකිරීමට බලය ඇතිව සිටියේය.
C. අගමැතිවරුන්ට පවරන විෂයන් තිරණය කළේය.
D. මහ මැතිවරණයක් අවසන් වූ විට ඉල්ලා අස්වූ ලෙස සැලකේ.
E. 1972 ව්‍යවස්ථාවෙන් නිර්මිත සත්‍ය විධායකය අගමැතිවරයා වේ.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

43. ජාතික රාජ්‍ය සභාවේ සාමාජිකයන්

A. ප්‍රාදේශිය නියෝජනය පදනම් කර ගෙන තෝරාපත් කර ගන්නා ලදී.
B. ඡන්දයෙන් තෝරාපත් කළ සහ නාමකරණයෙන් පත් කළ නියෝජිතයන්ගෙන් සමන්විත විය.
C. සාමාජිකයන් එක් අයෙකු කථානායක ලෙස තෝරාපත් කර ගන්නා ලදී.
D. කැබිනට් මණ්ඩලයේ සාමාජිකයන් ලෙස පත්කිරීමට සුදුස්සන් විය.
E. ප්‍රථම ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රි සංඛ්‍යාව 157 ක් විය.

i) ABCD ii) BCDE iii) ABDE iv) ACDE v) ABCE

**වැරදි ප්‍රකාශය තෝරන්න.**

44. ශ්‍රී ලංකා පළාත් සභාව,

1- ඉන්දු ලංකා ගිවිසුමේ ප්‍රතිඵලයක් ලෙස ඇතිකරන ලදී.
2- වර්ග කිලෝමීටරයකට එක් නියෝජිතයෙකු හෝ ජනගහනයෙන් 60,000 කට එක් නියෝජිතයෙකු බැගින් විය.
3- 1987 අංක 47 දරණ පාර්ලිමේන්තු පනතෙන් පළාත් සභා පිහිටුවීමට නියම විය.
4- සමානුපාතික නියෝජන ක්‍රමයේ වරණීය ඡන්දක්‍රමය මත නියෝජිතයන් තෝරාපත් කර ගනියි.
5- නිල කාලය ආරම්භ දිනයේ සිට අවුරුදු 5 ක් බව දක්වා ඇත.

45. ඔම්බුඩ්ස්මන්

1- රාජ්‍ය නිලධාරීන්ට විරුද්ධ ව පැමිණිලි විමර්ශනය කරයි
2- රාජ්‍ය නිලධාරීන්ගේ හිතුවක්කාරී ක්‍රියාවන්ගෙන් පුරවැසියන් ආරක්ෂා කරයි.
3- මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධ පරීක්ෂණය පැවැත්වීම සඳහා ඕනෑම රාජ්‍ය ආයතනයකට වාර්තා ඉදිරිපත් කිරීමේ බලය ඇත.
4- යමෙකුගේ භාරයේ හෝ අත්අඩංගුවේ පසුවන තැනැත්තෙකු විභාග කිරීම සඳහා තමා වෙත ඉදිරිපත් කරන ලෙස නියෝගකිරීමට බලය ඇත.
5- මූලික අයිතිවාසිකම් කඩවී ඇත්නම් ඔහු සුදුසු යැයි කල්පනා කරන නිර්දේශ ඉදිරිපත් කිරීමට බලය ඇත.

46. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මහා මැතිවරණයකින් පසු පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීමේදී

1- කථානායක, නියෝජ්‍ය කථානායක, නියෝජ්‍ය කාරක සභා සභාපති තනතුරු පත් කරයි.
2- ඒ සඳහා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු තුන් දෙනෙක් යෝජනා සම්මතයෙන් පත් කර ගනියි.
3- මෙම පත්කිරීම්වලින් පසු එම මන්ත්‍රීවරුන් මන්ත්‍රීධුරවලින් ඉල්ලා අස්විය යුතුය.
4- පාර්ලිමේන්තුව විසුරුවා හරින තෙක් එම පදවි දරන්නේය.
5- පාර්ලිමේන්තුවේ මන්ත්‍රී මණ්ඩලය විසින් ඔවුන් එම පදවිවලින් ඉවත් කිරීමට බලය ඇත.

47. 1978 ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව

1- අවුරුද්දට එක් වතාවක් හෝ රැස්විය යුතුය.
2- පාර්ලිමේන්තුවේ සෑම සැසි වාරයකම ආරම්භයේදී ජනාධිපති විසින් ප්‍රතිපත්ති කතාව පැවැත්විය යුතුය.
3- වසරක් තුළ පාර්ලිමේන්තුව පවත්වන රැස්වීමම් මාලාව එක් සැසිවාරයක් ලෙස සැලකේ.
4- සැසිවාරයක් ආරම්භ වී ඊළඟ සැසිවාරය ට දින නියම කරන්නේ අගමැතිවරයාය.
5- පාර්ලිමේන්තුවේ රැස්වීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය ගණ පූරණය වන්නේ 20 කි.

48. 1978 ව්‍යවස්ථාවට අනුව ජනාධිපති

1- රාජ්‍යයේ නායකයා මෙන්ම ආණ්ඩුවේ ද නායකයා වන්නේය.
2- අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙකු ද වන්නේය.
3- කැබිනට් මණ්ඩලයේ නායකයා ද වන අතර, පාර්ලිමේන්තුවට වගකීමට බැඳී සිටින්නේය.
4- කැබිනට් මණ්ඩලය විසිර ගිය ද ජනාධිපතිවරයා ධුරය දරන්නේය.
5- අමාත්‍යවරුන්ට අයත් විෂයන් සහ කාර්යයන් තීරණය කරන්නේ ද ජනාධිපතිවරයා ය.

49. 1978 ජනාධිපතිවරයාට වරදකරුවන්ට සමාව දීමේ බලය සතු වේ. ඒ අනුව

1- සම්පූර්ණ සමාවක් හෝ නීත්‍යානුකූල කොන්දේසිය සහිත සමාවක් දීම
2- නියම කරන ලද දඬුවමක් දින නියමයක් ඇතිව හෝ නැතිව කල් දැමීම
3- නිය කරන ලද දඬුවමක්, දඩ මුදලක් සමග මුලුමනින්ම නිෂ්ප්‍රභ කිරීම
4- රාජසන්තක කරන ලද වස්තුවක් මුලුමනින්ම හෝ අර්ධ වශයෙන් අත්හිටුවීම
5- නියම කරන ලද දඬුවමක් වෙනුවට ලිහිල් දඬුවමක් නියම කිරීම

50. ජාත්‍යන්තර ක්ෂමා ආයතනයන් හි අරමුණු

1- මානව අයිතිවාසිකම් කඩවූවන්ට සාධාරණත්වය ලබාදෙයි.
2- මානව අයිතිවාසිකම් කඩවීම් අවසන් කරන්නට මාධ්‍ය අවධානය යොමු කරවයි.
3- ඍජු අභියාචනා ඉදිරිපත් කිරීම හා ඒ පිළිබඳ සමීක්ෂණ පවත්වයි.
4- සරණාගතයන් හා පීඩිතයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටියි.
5- සාමාජික රටවල වෙළඳ ගනුදෙනු වලට ආධාර කරයි.

## ඩී.එස්. සේනානායක විදුහල. කොළඹ 07.

විභාග පූර්ව පරීක්ෂණය - 2016 - ජුනි
13 ශ්‍රේණිය
දේශපාලන විද්‍යාව - II

කාලය පැය 03 යි

**මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 2 කින් යුක්ත වේ. "A" කොටසේ සියලුම ප්‍රශ්න වලට එහිම පිළිතුරු සපයන්න.**
**B කොටසින් හා C කොටස් 2 කින්ම ප්‍රශ්න 2 බැගින් ඇතුලත් වන සේ ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

### A කොටස

**එක් ප්‍රශ්නයන්ට එක් ලකුණක් බැගින් ලකුණු 20 ක්**

01. දේශපාලන විද්‍යාව විෂය ක්ෂේත්‍රයට අළුතින් එක්වූ නවාංග 2 ක් දක්වන්න.

1. ..............................................................................................
2. ..............................................................................................

02. පහත සඳහන් දේශපාලන න්‍යායන් හඳුන්වා දුන් චින්තකයින් නම් කරන්න.

1. බලතල බෙදීමේ න්‍යාය -
2. පද්ධති විශ්ලේෂණ ක්‍රමය -

03. මාක්ස්වාදී විග්‍රහයට අනුව සමාජය සමන්විත වන්නේ ප්‍රධාන පන්ති 2 කිනි. ඒවා මෙනවාද ?

1. ..............................................................................................
2. ..............................................................................................

04. ව්‍යවස්ථානුකූල වාදයට අදාලව පිළිගත් සම්ප්‍රදායික කොන්දේසි 2 කුමක්ද ?

1. ..............................................................................................
2. ..............................................................................................

05. දේශපාලන පක්ෂයකින් ඉටුවිය යුතු කාර්යයන් 2 ක් දක්වන්න.

1. ..............................................................................................
2. ..............................................................................................

06. ආණ්ඩුවක බලය සංවරණය කිරීම යොදාගෙන ඇති සංවරණ මූලධර්ම 2 ක් දක්වන්න.

1. ..............................................................................................
2. ..............................................................................................

07. සන්ධීය ආණ්ඩුක්‍රමයක ලක්ෂණ 2 ක් සඳහන් කරන්න.

1. ..............................................................................................
2. ..............................................................................................

08. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන්හි අධිකරණවලට විනිශ්‍යකරුවන් පත් කෙරෙන ක්‍රම අතුරෙන් දෙකක් සඳහන් කරන්න.

1. ..................................................................................................
2. ..................................................................................................

09. ස්වාධිපත්‍ය ප්‍රධාන වශයෙන් කොටස් 2 කට බෙදා ඇත. ඒවා නම් කරන්න.

1. ..................................................................................................
2. ..................................................................................................

10. සිවිල් සමාජයක ලක්ෂණ 2 ක් දක්වන්න.

1. ..................................................................................................
2. ..................................................................................................

11. ෆැසිස්ට්වාදි රාජ්‍යක දැකිය හැකි ලක්ෂණ 2 ක් දක්වන්න.

1. ..................................................................................................
2. ..................................................................................................

12. ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට රාජ්‍ය විසින් යොදා ඇති විධිවිධාන කවරේද ?

1. ..................................................................................................
2. ..................................................................................................

13. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වාදුන් ප්‍රතිසංස්කරණ යෝජනා 2 ක් දක්වන්න.

1. ..................................................................................................
2. ..................................................................................................

14 1931 සර්වජන ඡන්ද බලය මෙරට ජනතාවට හඳුන්වා දෙන ලදී. එම අවස්ථාවේ ඡන්ද බලය ලබාගැනීමට සපුරාලිය යුතු වූ සුදුසුකම් කවරේද ?

1. ..................................................................................................
2. ..................................................................................................

15. ලංකාවේ ප්‍රථම වාමාංශික පක්ෂය වූ ලංකා සමසමාජ පක්ෂය පිහිටුවීමේදී ඔවුන් අපේක්ෂා කළ අරමුණු 2 දක්වන්න.

1. ..................................................................................................
2. ..................................................................................................

16. ලංකාවේ ජාතික ව්‍යාපාරය, අසංවිධානාත්මක, දුර්වල එකක් වීමට බලපෑ සාධක 2 ක් දක්වන්න.

1. ..................................................................................................
2, ..................................................................................................

17. ඇමරිකානු කොන්ග්‍රස් මණ්ඩලයට ඇතුලත්ව ඇති මණ්ඩල 2 ක් නම් කරන්න.

1. ..............................................................................
2. ..............................................................................

18. 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාවට පරමාධිපත්‍ය බලය හිමිවිය. එය පිළිඹිබු වන අවස්ථා 2 ක් දක්වන්න.

1. ..............................................................................
2. ..............................................................................

19. 1978 දෙවනජනරජ ව්‍යවස්ථාව බිහිකිරිමට තුඩුදුන් කරුණු මොනවාද ?

1. ..............................................................................
2. ..............................................................................

20. 1978 ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව සතු ව්‍යවස්ථා දායක බලතල හීනවිය. හේතු 2 ක් දක්වන්න.

1. ..............................................................................
2. ..............................................................................

e තක්සලාව අධ්‍යාපනය The National e-learning Portal for The General Education

විභාග පූර්ව පරීක්ෂණය - 2016 - ජුනි
13 ශ්‍රේණිය
දේශපාලන විද්‍යාව - II

**B කොටසින් ප්‍රශ්න 2 ක්ද C කොටසින් ප්‍රශ්න 2 කද වනසේ ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

## B කොටස

01. දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය බවට පත්ව ඇති තේමාවන් පිළිබඳ විමසුමක් කරන්න.

02. පහත දැක්වෙන ඒවායින් 2ක් පිළිබඳ සාකච්ඡා කරන්න.

i. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක කාර්යභාරය
ii. අධිකරණයේ ස්වාධීනත්වය
iii. ජනමාධ්‍ය හා දේශපාලනය
iv. සිවිල් සමාජය

03. පහත දැක්වෙන ඒවා විභාග කරන්න.

i. ආණ්ඩුව යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද ? සහ එහි කාර්යයන් මොනවාද ?
ii. ආණ්ඩුවේ බලය හා ආණ්ඩුවේ බලය සංවරණය කරණ විධික්‍රම දක්වන්න.

04. පහත දැක්වෙන ඕනෑම 2ක් විභාග කරන්න

i. මානව අයිතිවාසිකම් මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ විධික්‍රම
ii. ගැටුම් හා ගැටුම් වැළැක්වීම
iii. ස්විස්ටර්ලන්ත ආණ්ඩුක්‍රමයේ සාමූහික විධායකය
iv. ජනාධිපති ආණ්ඩුක්‍රමයේ යහපත් ලක්ෂණ
v. ඉන්දියානු ආණ්ඩුක්‍රමයේ සන්ධීය මූලධර්ම

## C කොටස

05. කෝල්බෲක් කැමරන් යෝජනා දක්වා ශ්‍රී ලංකා සමාජ ආර්ථිකයට ඉන් වූ බලපෑම සාකච්ඡා කරන්න

06. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින්

i. සර්වජන ඡන්දබලය ප්‍රදානය කිරීමත්
ii. විධායක කාරක සභා පිහිටුවීමෙන් වැදගත්කම සාකච්ඡා කරන්න

07. සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පහත දැක්වෙන ඒවා විභාග කරන්න

i. නාමික විධායකයේ තත්වය හා බලතල
ii. පාර්ලිමේන්තුවේ සංයුතිය හා බලතල

08. පහත දැක්වෙන මාතෘකා දෙකක් ගැන අදහස් දක්වන්න

i. 1978 ව්‍යවස්ථාව යටතේ ජනාධිපති සතු බලතල
ii. 1978 ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතල හා කාර්යයන්
iii. 1972 ව්‍යවස්ථාව යටතේ විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර පවත්නා සම්බන්ධතා
iv. 1978 ව්‍යවස්ථාව යටතේ විධායකය හා ව්‍යවස්ථාදායකය අතර පවත්නා සම්බන්ධතාවය